**#mediaethicsSL#lka#SinhalaPress#Divaina#January16**

මාගම ප්‍රදේශයේ සිදුවූ කණගාටුදායක සිදුවීම වාර්තා කිරීමේදී මනා සංයමයකින් යුතුව, මාධ්‍ය ආචාර ධර්මයන් කඩ නොකරමින් කටයුතු කිරීම සහ නොකිරීම සම්බන්ධයෙන් පසුගිය දිනයේදීද අප පෙන්වා දුන්නෙමු. අද දිනයේදීද දිවයින පුවත්පත මගින් මෙම සිදුවීම මාධ්‍ය ආචාර ධර්මයන් හෝ යෝග්‍ය මාධ්‍ය භාවිතාවන් නොතකා හරිමින් වාර්තා කොට තිබීම කණගාටුවට කරුණකි.

දිවයින ලිපිය සමගින් ජීවිතය නැති වූ දියණියගේ සහ ඇගේ මවගේ බොඳ නොකළ ඡායාරූප පළ කර තිබුණු අතර, ඇගේ නමද සඳහන් කොට තිබිණි. එසේම ඇය ජීවිතය නැතිකරගැනීමට උත්සාහයක් ගැනීමට පෙරාතුව ලියූ ලිපියේ සම්පූර්ණ සේයාරුවක් පළ කර තිබූ අතර, එම ලිපියේ යම් යම් උපුටනයන්ද දක්වා තිබේ. එසේම ජීවිතය නැතිකර ගැනීමේ ඇගේ ප්‍රයත්නය, යොදාගත් ක්‍රමය යනාදිය විස්තරාත්මකව දක්වා තිබේ. මෙසේ පළ කරන ලිපිය සමගින් අඩු තරමින් උපකාරක අංකයන් (1333) හෝ සඳහන් කිරීමද අතපසු කර තිබේ.

සියදිවි හානිකරගැනීමක් වාර්තා කිරීමේදී අතිශයින්ම ප්‍රවේසම් සහගත විය යුතු බව අප විසින් පුන පුනා සිහිපත් කරන්නේත්, ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගත් මාධ්‍ය ආචාර ධර්මයන් තිබෙන්නේත්, වඩාත් යෝග්‍ය මාධ්‍ය හැසිරවීම් මේ යැයි අනුදැන ඇත්තේත්, වාර්තාකරණය සමගින් සිදුවිය හැකි අනුකරණාත්මක සියදිවි හානිකරගැනීම් වළක්වා ලීමටත්, සමස්තයක් ලෙසින් මෙම සමාජ ගැටළුව අවම කිරීමටත් බව දැන්වත් තේරුම් ගැනීමට දිවයින ඇතුළු අනෙකුත් පුවත්පත් වලට හැකියාවක් තිබේ නම් අගනේයි.